# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,491 - 2026 මැයි මස 29 සිකුරාදා - 2026.05.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

# II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 138 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජුනි මස 19 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජුනි මස 05 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

**අවිස්සාවේල්ල දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී,
සීමාසහිත සණස සංවර්ධන බැංකුව යන නාමයෙන් ද හැඳින්වේ.
අංක 12, එඩ්මන්ටන් පාර,
කිරුළපන, කොළඹ 06.

අවිස්සාවේල්ල දිසා අධිකරණ
නඩු අංකය : MB/27620
අවිස්සාවේල්ල දිසා අධිකරණ
ඇස්කිසි අංකය : 250/2025.

*............පැමිණිලිකරු.*

*එදිරිව*

1. රත්නසේකර මුදියන්සේලාගේ තිළිණ ප්‍රදීප් දිල්රුක් රත්නසේකර,
පොල්වත්ත, මාලිගාතැන්න,
දැරණියගල.

2. දෙවරාදූර පද්මා බන්දුනී,
පොල්වත්ත, මාලිගාතැන්න,
දැරණියගල.

*...........විත්තිකරුවන්.*

ඉහත අංක දරන නඩුවේ 2023.03.30 දිනැති තීන්දු ප්‍රකාශය ප්‍රකාරව පැමිණිල්ලේ ඉල්ලා ඇති මුදල වන රු. 515,264.35 ක මුදල සහ රු. 482,479.50 ක මුදල වර්ෂ 2015.12.08 දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන දින තෙක් වාර්ෂිකව 20% බැගින් පොළිය සහ අනෙකුත් වියදම් ගාස්තු 1 විත්තිකරුගෙන් පැමිණිලිකාර සමාගම වෙත අයකර ගත හැකි බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

1 විත්තිකරු සන්තකයේ ඇති නිශ්චල දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ඉහත කී මුදල සහ ඇස්කිසි ලබා ගැනීමට අදාළ වියදම් මුදල පැමිණිලිකාර බැංකුවට අයකර ගැනීම සඳහා 1 විත්තිකරුට විරුද්ධව ඇස්කිසි ක්‍රියාත්මක කිරීමට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

එකී තීන්දුව ඉටුකිරීමට 1 විත්තිකරු විසින් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා අවිස්සාවේල්ල දිසා අධිකරණ නඩු අංක MB/27620 දරන නඩුව යටතේ නිකුත් කර ඇති ඇස්කිසිය ප්‍රකාරව, අවිස්සාවේල්ල දිසා අධිකරණයේ පූර්ව රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන පී. කේ. එන්. තිස්ස මහත්මිය විසින් වර්ෂ 2026 ක් වූ ජනවාරි මස 06 දින නිසිලෙස තහනම් කරන ලද 1 විත්තිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ, අවිස්සාවේල්ල දිසා අධිකරණයේ තත්කාලීන රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල් වන මා විසින්,

**වර්ෂ 2026 ක් වූ ජූලි මස 16 දින පෙරවරු 11.00 ට,**

එකී නිශ්චල දේපළ පිහිටා ඇති ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද,
2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ අයකිරීම් ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30ක් ඇතුළත අවිස්සාවේල්ල, දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ නැගෙනහිර අටළුගම් කෝරළේ, දැරණියගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ, අංක 114, දැරණියගල උතුර ග්‍රාම නිලධාරි වසමේ, දැරණියගල යන ගම පිහිටි **"මාලිගාතැන්න වත්තෙන් කොටසක්"** ලෙස හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එම්. ඩී. පී. සමරදිවාකර මහතා විසින් මැන සකස් කරන ලද අංක 2231 සහ වර්ෂ 2013 ක් වූ ජනවාරි මස 08 දිනැති පිඹුර ප්‍රකාර කැබලි අංක 01 දරන බිම් කොටසට මායිම්, උතුරට : උඩහේන් කන්ද සිට දැරණියගල දක්වා වූ මීටර් 3.5 ක් පළල ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : ඩී. ඩබ්. අබේවර්ධනට (මියගොස්) අයත් මාලිගාතැන්න වත්ත නැමති ඉඩමෙන් කොටසක් ද, දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : අංක 755 පී දරන පිඹුරේ කැබලි අංක 05 ද, යන මෙකී මායිම් තුළ පිහිටි රූඩ් එකක් (රූඩ්. 01) විශාල ඉඩම් කොටස සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු ගහකොළ, පළතුරු ආදී සියලු දේත් වේ. මෙම ඉඩම අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 01/46 හි ලියාපදිංචි වී ඇත.

***දේපළට පිවිසීම :***

දෙහිඕවිට සිට දැරණියගල මාර්ගයේ දැරණියගල පොලිස් ස්ථානය පසුකර මී. 100 ක් පමණ ඉදිරියට යන විට මාර්ගයේ දකුණු පසට හමුවන මංවනායක මාවතට හැරී මීටර් 150 ක් පමණ ඉදිරියට යන විට මාර්ගයේ වම් පස අදාළ දේපළ පිහිටා ඇත.

එම්. ඒ. ඒ. එන්. කුමාරි,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
අවිස්සාවේල්ල.

වර්ෂ 2026 ක් වූ මැයි මස 12 දින,
අවිස්සාවේල්ල දිසා අධිකරණයේ දී.

05 - 342

---

**වත්තල දිසා අධිකරණ බල ප්‍රදේශයේ දී ය**

**පිස්කල් වෙන්දේසියේ විකිණීමයි**

යුනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී.,
අංක 64, ගාලු පාර,
කොළඹ 03.

කොළඹ දිසා අධිකරණයේ
නඩු අංකය : 107/2015/DMB
වත්තල අධිකරණයේ
ඇස්කිසි අංක : 105/25
වටිනාකම : රු. 3,759,804.83/-
ස්වභාවය : උකස්

ශාඛා කර්යාලය :

අංක 16 A, කොටහේන වීදිය, කොළඹ 13.

*............පැමිණිලිකරු.*

*එදිරිව*

කොළඹ 13, මහා විද්‍යාල මාවත, අංක 81/5 දරන ස්ථානයෙහි "ඩන් මෙට්ල්ස්" යන නාමය හා අභිලාශය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන,

3. සෙල්ලදොරේ පානිසෙල්වන්,
අංක 167/27, ඒ. එස්. ජී. ලියනගේ මාවත,
හේකිත්ත, වත්තල.

4. අතබාලගන් සුජාතා,
අංක 167/27, ඒ. එස්. ජී. ලියනගේ මාවත,
හේකිත්ත, වත්තල.

*...........විත්තිකරුවන්.*

වර්ෂ 2016ක් වූ ජූලි මස 01 දින කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ ඇතුළත් කර ඇති ඒකපාක්ෂික තීන්දු ප්‍රකාශය අනුව කටයුතු කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී තීන්දුව අනුව විත්තිකරුවන් විසින් පැමිණිලිකරු වෙත ගෙවීමට ඇති රුපියල් තිස් හත්ලක්ෂ පනස් නව දහස් අටසිය හතරයි ශත අසූ තුන (රු. 3,759,804.83) ක මුදලක් සහ ඒ මත වර්ෂ 2014.12.31 දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ වැඩිදුර පොළිය ව්‍යවස්ථාපිත ගාස්තු ද, නඩු ගාස්තු ද ලබා ගැනීම සඳහා විත්තිකරුවන්ට එරෙහිව ඇස්කිසි ක්‍රියාත්මක කිරීමට පැමිණිල්ලට අවසර දී ඇති බැවින්, ඉහත කී මුදල් ගෙවන ලෙස 1 හා 2 විත්තිකරුවන්ගෙන් ඉල්ලීමක් කර ඒ අනුව කටයුතු නොකරන්නේ නම් 1 හා 2 විත්තිකරුවන්ට අයත් පැමිණිල්ලේ සහ මේ සමග අමුණා ඇති විකිණීමේ අධිකාරි පත්‍රයෙහි උපලේඛනයේ සඳහන්වන මා විසින් තහනමට ගන්නා ලද පහත සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2026 ක්වූ ජූලි මස 06 දින පෙ. ව. 11.00ට,**

එම දේපළ පිහිටි අංක 167/27 ඒ. එස්. ජී. ලියනගේ මාවත, හේකිත්ත, වත්තල යන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ (හැඳල උප කාර්යාලය) වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 169 දරන හේකිත්ත ග්‍රාමසේවා නිලධාරි වසමේ, හේකිත්ත සහ හැඳල ගම්වල පිහිටි ඒ. එස්. පී. ලියනගේ මාවතේ (කලින් හේකිත්ත පාරේ) වරිපනම් අංක 167/28 (220/51) දරන, පොතුවිල්ලේකුඹුර, කඳුරුවැටිය කුඹුර, මාදන්ගහකුඹුර සහ නදුන්ගහවත්ත නමැති ඉඩමේ කොටස වශයෙන් හඳුන්වන, වර්තමානයේ සමස්ත වශයෙන් රෝයල් පර්ල් ගාර්ඩන්ස් වශයෙන් හඳුන්වන ඉඩමට බලයලත් මිනින්දෝරු සුදර්මන් සිරිපාල විසින් මැන සාදන ලද අංක 1869 සහ 2003 මාර්තු මස 20 දින දරන මානක පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 33 දරන බිම් කොටසට මායිම්,

උතුරට : එම ඉඩමේ කැබලි අංක 34, 2 සහ 3 ද, නැගෙනහිරට : එම ඉඩමේ කැබලි අංක 3, 4 සහ 32 ද, දකුණට : එම ඉඩමේ කැබලි අංක 32 සහ බලයලත් මිනින්දෝරු සුදර්මන් සිරිපාලන මහතා විසින් මැන සාදන ලද අංක 1857 සහ 2002 නොවැම්බර් මස 21 දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 2 (අඩි 20ක් පලළ පාර) ද, බස්නාහිරට : බලයලත් මිනින්දෝරු සුදර්මන් සිරිපාල මහතා විසින් මැන සාදන ලද අංක 1857 සහ 2002 නොවැම්බර් මස 21 දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 2 (අඩි 20ක් පළල පාර) සහ එම ඉඩමේ කැබලි අංක 34 ද යන මෙකී මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1869 දරන මානක පිඹුර අනුව පර්චස් නවයක් (පර්. 9) විශාල බිම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේත් සමගය. මෙම දේපළ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 975/95 දරන වෙළුමේ/පත්ඉරුවේ සහ වර්තමානයේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 45/49, 51 දරන වෙළුමේ/පත්ඉරුවේ යථා පරිදි ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
වත්තල.

වර්ෂ 2026 ක් වූ මැයි මස 21 දින දී ය.

05 - 434

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.